# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

## 25 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## ලකුණු බෙදී යාමේ ආකාරය

I පත්‍රය 01 x 40 = 40

II පත්‍රය

| | | |
|---|---|---|
| අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු | = | 18 |
| සෙසු ප්‍රශ්න 3කට 14 බැගින් | = | 42 |
| II පත්‍රය අවසාන ලකුණු | = | 60 |

අවසාන ලකුණු = 40 + 60 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග ☐ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ....................................................... √ △ $\frac{4}{5}$

.......................................................

.......................................................

(ii) ....................................................... √ △ $\frac{3}{5}$

.......................................................

.......................................................

(iii) ....................................................... √ △ $\frac{3}{5}$

.......................................................

.......................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = ☐ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉතිහාසය I (I කොටස)
வரலாறு I (பகுதி I)
History I (Part I)

25 S I

2019.08.26 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) මහාතිත්ථ　(2) ගෝකණ්ණතිත්ථ　(3) සූකරතිත්ථ
(4) කච්ඡකතිත්ථ　(5) කාලතිත්ථ　(.........)

**2.** (1) වංසත්ථප්පකාසිනී　(2) සමන්තපාසාදිකාව　(3) මනෝරථපූරණී
(4) සම්මෝහවිනෝදනී　(5) සුමංගලවිලාසිනී　(.........)

**3.** (1) උපෝසථඝර　(2) ජන්තාඝර　(3) ප්‍රතිමාඝර
(4) බෝධිඝර　(5) සූතිඝර　(.........)

**4.** (1) අපොන්සු　(2) අල්මේදා　(3) රිවඩ්
(4) සිල්වා　(5) ප්‍රනාන්දු　(.........)

**5.** (1) ඇන්ඩ්‍රූ කෝල්ඩ්කොට්　(2) හෙන්රි මන්ක් මේසන් මුවර්　(3) සෝල්බරි
(4) ඔලිවර් ගුණතිලක　(5) විලියම් ගොපල්ලව　(.........)

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**6.** (1) අභයවාපී - තිසා වැව
(2) මණිහිරවාපී - මින්නේරි වැව
(3) කාණවාපී - මහකණදරා වැව
(4) පත්තපාසානවාපී - නාච්චදූව වැව
(5) ගංගාතටාකවාපී - කන්තලේ වැව　(.........)

**7.** (1) රජරට - පොළොන්නරුව
(2) දක්ඛිණදේශ - පුංකගාම
(3) දොළොස්දහස්රට - මහානාගහුල
(4) අටදහස්රට - උදුන්දොර
(5) මායාරට - මහියංගණය (.........)

**8.** (1) වීරශෝළියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි
(2) හත්ථවනගල්ල විහාර වංසය - හත්ථිකුච්ඡි විහාරයේ වංසකථාව
(3) කඳවුරු සිරිත - දඹදෙණි යුගයේ රජවරුන්ගේ එදිනෙදා ජීවිතය පිළිබඳ විස්තරයකි
(4) සරජෝතිමාලෙයි - ජ්‍යොතිශාස්ත්‍රය පිළිබඳ දෙමළ භාෂාවෙන් රචිත ග්‍රන්ථයකි
(5) නිකාය සංග්‍රහය - ශාසන ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයකි (.........)

**9.** (1) ධර්මපාල - දොම් ජුවාන්
(2) යමසිංහ බණ්ඩාර - දොම් ෆිලිප්
(3) නිකපිටියේ බණ්ඩාර - දොම් මැනුවෙල්
(4) කුසුමාසන දේවී - දෝන කැතරිනා
(5) කොනප්පු බණ්ඩාර - ඔස්ට්‍රියාවේ දොම් ජුවාන් (.........)

**10.** (1) තාරකා බලකොටුව - මාතර
(2) මැක්ඩොවල් බලකොටුව - මාතලේ
(3) මැක්ඩොනල්ඩ් බලකොටුව - බදුල්ල
(4) ෆ්‍රෙඩ්රික් බලකොටුව - ගාල්ල
(5) ඔස්ටෙන්බර්ග් බලකොටුව - ත්‍රිකුණාමලය (.........)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**11.**

| X | Y |
|---|---|
| (i) එළාර | A කිත් නුවරගල් |
| (ii) වළගම්බා | B දීඝජන්තු |
| (iii) ධාතුසේන | C චල |
| (iv) පළමුවන විජයබාහු | D මිගාර |
| (v) පළමුවන පරාක්‍රමබාහු | E කපිසීය |

(1) AECDB (2) BEDCA (3) CEBAD (4) DAECB (5) EBDAC (.........)

**12.**

| X | Y |
|---|---|
| (i) සාරාර්ථ සංග්‍රහය | A පස්වන කාශ්‍යප |
| (ii) ජානකීහරණය | B දෙවන පරාක්‍රමබාහු |
| (iii) දම්පියා අටුවා ගැටපදය | C හතරවන සේන |
| (iv) සියබස්ලකර | D කුමාරධාතුසේන |
| (v) කව්සිළුමිණ | E බුද්ධදාස |

(1) BACED (2) DAEBC (3) ECABD (4) EDACB (5) EDCAB (.........)

**13.**

| X | Y |
|---|---|
| (i) ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම | A හර්කියුලීස් රොබින්සන් |
| (ii) කොළඹ-මහනුවර මාර්ගය ඉදිකිරීම | B හෙන්රි මැකලම් |
| (iii) මහනගර සභා පිහිටුවීම | C විලියම් මැනිං |
| (iv) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම | D ෆ්‍රෙඩ්රික් නෝර්ත් |
| (v) යුනිවසිටි කොලීජිය පිහිටුවීම | E එඩ්වඩ් බාන්ස් |

(1) BAECD (2) CEABD (3) CEADB (4) DEABC (5) ECDBA (.........)

**14.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් | A | උඩරට ප්‍රදේශවල රෙසිඩන්ට්වරයා |
| (ii) | ජෝන් ඩොයිලි | B | විජිත ලේකම් |
| (iii) | ජෝර්ජ් ටර්නර් | C | පුරාවිද්‍යා කොමසාරිස් |
| (iv) | එමර්සන් ටෙනන්ට් | D | මධ්‍යම පළාතේ පළමුවන ඒජන්තවරයා |
| (v) | එච්. සී. පී. බෙල් | E | අග්‍ර විනිශ්චයකාරවරයා |

(1) ADCEB (2) DEBAC (3) EADBC (4) EBACD (5) EDACB (.........)

**15.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | ඒ. එෆ්. මොලමුරේ | A | ප්‍රථම සභානායක |
| (ii) | ඩී. බී. ජයතිලක | B | ප්‍රථම විධායක ජනාධිපති |
| (iii) | ඩී. එස්. සේනානායක | C | ප්‍රථම විපක්ෂ නායක |
| (iv) | එන්. එම්. පෙරේරා | D | ප්‍රථම අගමැති |
| (v) | ජේ. ආර්. ජයවර්ධන | E | ප්‍රථම කථානායක |

(1) BEACD (2) CAEDB (3) CEABD (4) EADBC (5) EADCB (.........)

● අංක **16** සිට **20** තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**16. ශ්‍රී ලංකාවේ ආදිතම රජවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) විජය, පණ්ඩුවාසුදේව, උපතිස්ස, පණ්ඩුකාභය, මුටසීව
(2) විජය, පණ්ඩුවාසුදේව, පණ්ඩුකාභය, උපතිස්ස, මුටසීව
(3) විජය, උපතිස්ස, පණ්ඩුවාසුදේව, පණ්ඩුකාභය, මුටසීව
(4) විජය, උපතිස්ස, පණ්ඩුකාභය, පණ්ඩුවාසුදේව, මුටසීව
(5) උපතිස්ස, විජය, පණ්ඩුවාසුදේව, මුටසීව, පණ්ඩුකාභය (.........)

**17. අනුරාධපුර පිහිටා ඇති පහත සඳහන් ස්තූප ඉදිකරවන ලද රාජ්‍ය සමයන්ට අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේ ද?**

(1) ථූපාරාමය, අභයගිරිය, රුවන්වැලිසෑය, ජේතවනය
(2) ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය
(3) ථූපාරාමය, රුවන්වැලිසෑය, ජේතවනය, අභයගිරිය
(4) ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, රුවන්වැලිසෑය
(5) රුවන්වැලිසෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය (.........)

**18. පොළොන්නරු යුගයේ දී රචිත සාහිත්‍ය කෘති අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) සසදාවත, ධර්මප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ
(2) සසදාවත, ධර්මප්‍රදීපිකාව, පූජාවලිය, අමාවතුර
(3) සසදාවත, සද්ධර්මරත්නාවලිය, අමාවතුර, බුත්සරණ
(4) ධර්මප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, බුත්සරණ
(5) සසදාවත, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ (.........)

**19. ශ්‍රී ලංකාවේ සිටි පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරුන්ගේ නම් අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) ජුවාන් රිබෙයිරෝ, පෙද්‍රෝ ලෝපේස් ද සූසා, ජෙරනිමෝ ද අසවේදු, දියෝගු ද මේලෝ ද කස්ත්‍රෝ
(2) ජෙරනිමෝ ද අසවේදු, කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා, දියෝගු ද මේලෝ ද කස්ත්‍රෝ, දියෝගු ද කූතෝ
(3) ජෙරනිමෝ ද අසවේදු, ජුවාන් ද බැරොස්, පෙද්‍රෝ ලෝපේස් ද සූසා, ජුවාන් රිබෙයිරෝ
(4) පෙද්‍රෝ ලෝපේස් ද සූසා, ජෙරනිමෝ ද අසවේදු, කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා, ජුවාන් රිබෙයිරෝ
(5) පෙද්‍රෝ ලෝපේස් ද සූසා, ජෙරනිමෝ ද අසවේදු, කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා, දියෝගු ද මේලෝ ද කස්ත්‍රෝ (.........)

**20. දහනවවන සියවසේ දී බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කරන ලද පළාත්වල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) වයඹ, මධ්‍යම, උතුරුමැද, ඌව, සබරගමුව
(2) මධ්‍යම, උතුරුමැද, වයඹ, සබරගමුව, ඌව
(3) උතුරුමැද, වයඹ, මධ්‍යම, ඌව, සබරගමුව
(4) මධ්‍යම, වයඹ, උතුරුමැද, ඌව, සබරගමුව
(5) මධ්‍යම, සබරගමුව, උතුරුමැද, වයඹ, ඌව (………)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. අනුරාධපුර යුගයේ රාජ්‍ය ආදායම**

(1) ඉඩම් බද්ද ප්‍රධාන ආදායම් මාර්ගය විය.
(2) අනුරාධපුර යුගයේ මුල් අවධියේ දී ඉඩම් බද්ද බොජකපති නමින් හඳුන්වන ලදී.
(3) ජල බද්ද දකපති නම් විය.
(4) වරායවල දී අය කළ තීරු බදු ද තවත් රජයේ ආදායම් මාර්ගයක් විය.
(5) විහාරගම්වලින් ද රාජකීය බදු අය කරන ලදී. (………)

**22. සීගිරිය**

(1) සීගිරිය පළමුවන කාශ්‍යප රජුගේ පරිපාලන මධ්‍යස්ථානය විය.
(2) සීගිරියේ දෙවන ආලකමන්දාවක් ගොඩනැගූ පළමුවන කාශ්‍යප, කුවේරයා මෙන් එහි වාසය කළේ යැ'යි කියනු ලැබේ.
(3) කාශ්‍යපගෙන් පසු පළමුවන මුගලන් කෙටි කලකට සීගිරිය සිය අගනගරය බවට පත් කරගත්තේ ය.
(4) සීගිරි චිත්‍රවල එන කාන්තා රූප, විදුලිය හා වලාකුළු නිරූපණය කරතියි මහාචාර්ය පරණවිතාන මහතා තර්ක කරයි.
(5) සීගිරි ජල උද්‍යානය පුරාණ ලංකාවේ උද්‍යාන නිර්මාණයේ සුවිශේෂී කාර්ය සිද්ධියකි. (………)

**23. කුරුණෑගල යුගය**

(1) දෙවන භුවනෙකබාහු රජතුමා සිය අගනගරය කුරුණෑගලට ගෙන ආවේ ය.
(2) හතරවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1302 දී සිහසුනට පත්විය.
(3) කුරුණෑගල රජ කළ වැදගත් ම පාලකයා හතරවන පරාක්‍රමබාහු ය.
(4) පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල යුගයේ දී රචනා කරන ලදී.
(5) ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම් කුරුණෑගල යුගයට අයත් ය. (………)

**24. දහඅට වන සියවසේ දෙවන භාගයේ උඩරට රාජධානියේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය**

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය යටතේ මෙම පුනර්ජීවනය සිදු විය.
(2) භික්ෂු උපසම්පදාව යළි පිහිටුවන ලදී.
(3) අමරපුර නිකාය ආරම්භ කරන ලදී.
(4) වැලිවිට සරණංකර හිමිපාණන් වෙත සංඝරාජ පදවිය ප්‍රදානය කරනු ලැබී ය.
(5) වාර්ෂිකව දෙවියන් වෙනුවෙන් පැවැත්වූ ඇසළ පෙරහැරට දළදා පෙරහැර හඳුන්වා දෙන ලදී. (………)

**25. දහනව වන සියවසේ වතු වගාව**

(1) ජෝර්ජ් බර්ඩ් පළමුවන කෝපි වත්ත සිංහපිටියේ ආරම්භ කළේ ය.
(2) කෝපි වතු වගාවේ පරිහානියෙන් පසු සිංකෝනා වගාව හඳුන්වා දෙන ලදී.
(3) පොල් වගාව ප්‍රධාන වශයෙන් ගෙන යන ලද්දේ ස්වදේශික ධනවතුන් විසිනි.
(4) ජේම්ස් ටේලර් ලූල්කඳුරේ තේ වත්තක් ආරම්භ කළේ ය.
(5) දහනව වන සියවසේ අවසාන දශකවල දී රටේ විශාලතම අපනයන නිෂ්පාදනය වූයේ රබර් ය.
(………)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26. පුරාණ අවධියේ ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ශ්‍රී ලංකාව පාණ්ඩ්‍ය හා චෝළ යන දෙපක්ෂයේ ම ආක්‍රමණවලට ලක් විය.
(B) එළාර පාණ්ඩ්‍ය පාලකයෙකි.
(C) චෝළ ආක්‍රමණයක ප්‍රතිඵලයක් වශයෙන් අනුරාධපුර රාජධානිය බිඳවැටුණි.
(D) මාරවර්මන් සුන්දර පාණ්ඩ්‍ය ශ්‍රී ලංකාව යටත් කරගැනීමට සමත් විය. (.........)

**27. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) චෝළයන් සමග විවාහ සම්බන්ධතා
(B) චීනය සමග සම්බන්ධතා
(C) බුරුම ආක්‍රමණය
(D) කාම්බෝජය සමග මිත්‍ර සම්බන්ධතා (.........)

**28. උඩරට රාජධානියේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) රජු හා මොල්ලිගොඩ මහාදිකාරම් අතර පැවැති ගැටුම
(B) රජුට ජනතා සහයෝගය අහිමි වීම
(C) බ්‍රිතාන්‍යයන්ගේ කුමන්ත්‍රණකාරී ප්‍රතිපත්තිය
(D) බ්‍රිතාන්‍යයන් විසින් මහාමාර්ග ඉදිකිරීම (.........)

**29. බ්‍රිතාන්‍යයන් යටතේ පුරාණ වාරි කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) බ්‍රවුන්රිග් ඌරුබොක්ක හා කිරම වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කළේ ය.
(B) වෝර්ඩ් වියළි කලාපයේ පුරාණ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළේ ය.
(C) ග්‍රෙගරි ගම් වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළේ ය.
(D) ගෝඩ්න් කලා වැව ප්‍රතිසංස්කරණය කළේ ය. (.........)

**30. නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) පාර්ලිමේන්තුව සමන්විත වූයේ අග්‍රාණ්ඩුකාරවරයාගෙන්, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් හා සෙනෙට් සභාවෙනි.
(B) නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මන්ත්‍රීවරුන් 101 දෙනකුගෙන් සමන්විත විය.
(C) සියලු ම කැබිනට් ඇමතිවරුන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත්කර ගන්නා ලදී.
(D) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සෙනෙට් සභාව අහෝසි කරන ලදී. (.........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31. ශ්‍රී ලංකාවේ බෞද්ධ ශාසන ඉතිහාසයේ ප්‍රථම බෙදීම සිදු වූයේ කවර රජුගේ පාලන සමයේ දී ද?**
(1) සද්ධාතිස්ස (2) වළගම්බා (3) වෝහාරිකතිස්ස
(4) ගෝඨාභය (5) මහාසේන (.........)

**32.** **නැව් තොටක දී අය කළ තීරු බදු පිළිබඳ ව වාර්තා වන සෙල්ලිපිය කුමක් ද?**
(1) වේවැල්කැටිය (2) හෝපිටිගමු (3) ගොඩවාය
(4) අඹගමුව (5) සංගමු විහාර (.........)

**33.** **රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කාන්තා මන්ත්‍රීවරිය කවු ද?**
(1) ඇඩ්ලින් මොලමුරේ (2) මේරි රත්නම් (3) ඩොරීන් වික්‍රමසිංහ
(4) විවියන් ගුණවර්ධන (5) කුසුමා ගුණවර්ධන (.........)

**34.** **ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවු ද?**
(1) පොන්නම්බලම් රාමනාදන් (2) පොන්නම්බලම් අරුණාචලම්
(3) මාක්ස් ප්‍රනාන්දු (4) මුත්තු කුමාරස්වාමි
(5) ජී. ජී. පොන්නම්බලම් (.........)

**35.** **ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක් ද?**
(1) මින්නේරිය (2) මිණිපේ (3) ගල්ඔය
(4) කලා වැව (5) පරාක්‍රම සමුද්‍රය (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | වෝහාරිකතිස්ස රජතුමා දණ්ඩනයක් වශයෙන් ශාරීරික වධහිංසා අවලංගු කිරීමට නීති පැනවී ය. | පැරණි ශ්‍රී ලංකා ආර්ථිකයේ කේන්ද්‍රීය ලක්ෂණය වූයේ වෙළෙඳාමයි. | (.........) |
| **37.** | සුභ නම් හමුදා සෙන්පතියා ජයවර්ධනපුර කෝට්ටේ බලකොටුව ගොඩනැගීය. | ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ චීන සෙන්පති චන්ද්‍රබානු, වීර අලකේශ්වර නම් සිංහල රජු අල්ලාගෙන සිරකරුවකු ලෙස චීනයට ගෙන ගියේ ය. | (.........) |
| **38.** | පෘතුගීසීන් විසින් ආගම් ප්‍රචාරය හා අධ්‍යාපනය අතර ඇති කර තිබූ සමීප සබඳතාව ලන්දේසීන් විසින් දිගට ම පවත්වාගෙන යනු ලැබී ය. | පෘතුගීසීන් අරඹා තිබූ පාසල් තමන් වෙත පවරාගත් ලන්දේසීහු ඊට නව ජීවයක් ලබා දී ඒවායේ සංඛ්‍යාව වැඩි කොට, එම පාසල් දේවස්ථානවලට සම්බන්ධ කළහ. | (.........) |
| **39.** | වලානේ සිද්ධාර්ථ හිමියෝ පරම ධම්ම චේතිය පිරිවෙන රත්මලානේ පිහිටවූහ. | හික්කඩුවේ ශ්‍රී සුමංගල හා රත්මලානේ ශ්‍රී ධර්මාලෝක යන හිමිවරුන් විසින් විද්‍යෝදය හා විද්‍යාලංකාර යන පිරිවෙන් පිහිටුවන ලදී. | (.........) |
| **40.** | ඩී. එස්. සේනානායක මහතාගේ අභාවයෙන් පසු ජෝන් කොතලාවල මහතා අගමැති තනතුරට පත්විය. | 1956 සිට 1965 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩු නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් කෙරෙහි වඩාත් යොමු විය. | (.........) |

* *

[කත්වැනි පිටුව බලන්න]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

### පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

විෂය අංකය / பாட இலக்கம்: 25

විෂයය / பாடம்: ශ්‍රී ලංකාවේ ඉතිහාසය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 5 | 31. | 2 |
| 02. | 1 | 12. | 4 | 22. | 3 | 32. | 3 |
| 03. | 5 | 13. | 4 | 23. | 5 | 33. | 1 |
| 04. | 3 | 14. | 3 | 24. | 3 | 34. | 2 |
| 05. | 1 | 15. | 5 | 25. | 5 | 35. | 3 |
| 06. | 1 | 16. | 3 | 26. | 2 | 36. | 1 |
| 07. | 5 | 17. | 2 | 27. | 4 | 37. | 3 |
| 08. | 2 | 18. | 1 | 28. | 3 | 38. | 5 |
| 09. | 3 | 19. | 5 | 29. | 5 | 39. | 2 |
| 10. | 4 | 20. | 4 | 30. | 1 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

OLD


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | |
|---|---|---|
| ඉතිහාසය I<br>வரலாறு I<br>History I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. }



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු - පැරණි නිර්දේශය

## ඉතිහාසය I (II කොටස)

## ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:

- පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
  (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ගෝකණ්ණ (ii) අනුරාධපුරය (iii) කැලණි ගඟ (iv) මහියංගණය

(v) පරාක්‍රම සමුද්‍රය (vi) නල්ලූර් (vii) මඩකලපුව (viii) ඌව පළාත

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)

2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහි ලා අභ්‍යන්තර භූගෝලීය සාධක බලපෑ අයුරු පහත දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) මධ්‍යම කඳුකරය

(ii) ගංගා සහ ගංගා නිම්න

**(i) මධ්‍යම කඳුකරය**

- ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැඩගැස්වීමෙහිලා දිවයින මධ්‍යයේ, ප්‍රවේශවීමට දුෂ්කර කඳුකර ප්‍රදේශයක් පිහිටීම තීරණාත්මක ලෙස බලපා තිබීම.
- එම ප්‍රදේශය, ගිරිදුර්ග, ජලදුර්ග, වනදුර්ග ආදියෙන් ආරක්ෂා වී තිබීම හේතුකොටගෙන විදේශ ආක්‍රමණ හා සිවිල් අරගල අවස්ථාවලදී ආරක්ෂිත ස්ථානයක් බවට පත්වීම.
- මුල් යුගයේ සිටම රජවරුන් විදේශීය ආක්‍රමණ හමුවේ මෙම කලාපය අභය ස්ථානයක් වශයෙන් තෝරාගැනීම.
  නිදසුන්: දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ වට්ටගාමිණී අභය, I සේන හා I විජයබාහු වැනි පාලකයන්
- සෙසු ප්‍රදේශවල දේශපාලන ආරවුල් අවස්ථාවලදී රාජ උදහසට ලක් වූ පුද්ගලයන් ආරක්ෂාව පතා මෙම ප්‍රදේශයට පලා යාම.

නිදසුන්:; කාවන්තිස්ස රජුගේ උදහසට ලක් වූ දුටුගැමුණු කුමරු; II සංඝතිස්ස රජුගේ පුත් ජෙට්ඨතිස්ස කුමරු; II මහින්ද රජුට විරුද්ධ වූ ආදිපාද දප්පුල; II සේන රජුගේ උදහසට ලක් වූ මහාදිපාද මහින්ද.

- ක්‍රමයෙන් වෙනම දේශපාලන ඒකකයක් නිර්මාණය වීම හා රාජධානි බිහිවීම (ගම්පොල, මහනුවර).
- මෙම ප්‍රදේශයේ පිහිටීම හා ස්වභාවික බාධක හේතුකොටගෙන විදේශ ආක්‍රමණිකයන්ට - විශේෂයෙන්ම පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට (1803 දී ඉංග්‍රීසීන්ට) - උඩරට රාජධානිය යටත්කර ගත නොහැකි වීම.
- 1817/18 සහ 1848 යටත්විජිත විරෝධී ප්‍රතිරෝධ ව්‍යාපාරවල මූලස්ථානය වීම.
- ලංකාවේ ගංගා පද්ධතිය ආරම්භ වන කලාපය වීම.
- මෙරට සමාජ, ආර්ථික හා සංස්කෘතික ඉතිහාසයේ කැපී පෙනෙන වෙනස්වීම් සඳහා හේතු වූ වතු වැවිලි ආර්ථිකය ආරම්භ වූ කලාපය වීම.
- දළදා මාළිගාව මහනුවර ඉදිවීමත් සමග මෙරට ආගමික හා සංස්කෘතික ඉතිහාසයෙහිලා වැදගත් කලාපයක් බවට පත්වීම.

**(ii) ගංගා සහ ගංගා නිම්න**

- මධ්‍ය කඳුකරයේ සිට දිවයිනේ සෑම දිශාවකටම ගලා බසින වර්ෂය පුරා අඛණ්ඩව ජලය රැඳි, ගංගා පද්ධතියක් හා පළල් නිම්න සහිත ගංගාද්‍රෝණි තිබීම, මුල් ජනාවාස පිහිටුවීමට හා ඒවායේ ව්‍යාප්තියට බලපෑම (ගංගා ඔස්සේ රට අභ්‍යන්තරයට ජනාවාස ව්‍යාප්ත වීම):

  නිදසුන්: මල්වතු ඔය - අනුරාධගාම / තම්බපණ්ණි නගරය; කලා ඔය - උරුවේලගාම / විජිතගාම; කණදරා ඔය - උපතිස්සගාම; ගල් ඔය - දීඝගාම.

- රාජධානිවල අගනුවර ගංගාශ්‍රිතව බිහිවීම: මල්වතු ඔය - අනුරාධපුරය; මහවැලි ගඟ - පොළොන්නරුව.
- ප්‍රධාන ජීවනෝපාය, කෘෂිකර්මාන්තය වීම නිසා ජනාවාස මුල සිටම ගංගා නිම්නවල බිහිවීම: උතුරු තැන්න - කලා ඔය, මල්වතු ඔය; නැගෙනහිර තැන්න - වලවේ ගඟ, කිරිඳි ඔය
- වාරිකර්මාන්ත නිර්මාණයට/වර්ධනයට ගංගා ඉවහල්වීම: කලා ඔය - කලා වැව; මහවැලි ගඟ - මිණිපේ අමුණ.
- දේශසීමා වෙන් කිරීම සඳහා භාවිත වීම: රජරට - කලා ඔය හා මල්වතු ඔය; රුහුණු රට - මහවැලි ගඟ කළු/බෙන්තර ගංගා; දොළොස්දහස් රට - වලවේ ගඟ හා බෙන්තර ගඟ; අටදහස් රට - වලවේ ගඟ හා මහවැලි ගඟ.

- අනුරාධපුර හා රුහුණු රට පාලකයන්ගේ ආරක්ෂක කටයුතුවලට ගංගා ඉවහල්වීම: කාවන්තිස්ස රජු මහවැලි ගඟේ තොටමුණු සියල්ල රැකවල්ලෑම; I පරාක්‍රමබාහු රජු, විල්ගම්තොට සිට ත්‍රිකුණාමලය දක්වා සෑම තොටමුණක්ම රැකවල්ලෑම.

- ප්‍රවාහනය හා ගමනාගමනය සඳහා ගංගා භාවිත කිරීම. ගංගා ආශ්‍රිතව මාර්ග බිහිවීම: මාගම සිට රජරට තෙක් වූ මහවැලි ගඟ මාර්ගය.

- ගංගා මුවදොරවල හා තොටුපලවල වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවනු ලැබීම: මහාතිත්ථ, ගෝකණ්ණ හා ගොඩවාය වරායන්.

**(ලකුණු 14 යි)**

**3. "ශ්‍රී ලංකාව තුළ බුද්ධාගම පිහිටුවීම එහි සංස්කෘතික ලක්ෂණ කෙරෙහි පමණක් නොව දේශපාලන වර්ධනය කෙරෙහි ද ඉමහත් බලපෑමක් ඇති කළේය."**

**(i) බුද්ධාගම හඳුන්වා දෙන විට ශ්‍රී ලංකාව පාලනය කළ රජතුමා නම් කරන්න.**

තිස්ස / දේවානම්පියතිස්ස

**(ලකුණු 01 යි)**

**(ii) ශ්‍රී ලංකාවට භික්ෂු-භික්ෂුණී ශාසන හඳුන්වා දුන් තෙරුන් වහන්සේ සහ තෙරණින් වහන්සේ නම් කරන්න.**

මිහිඳු හිමි / සංඝමිත්තා තෙරණිය

**(ලකුණු 02 යි)**

**(iii) ශ්‍රී ලංකාව තුළ බුද්ධාගම පැතිරී යාමට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න.**

- වෘක්ෂ වන්දනය, දේව වන්දනය, මළවුන් ඇදහීම හා යක්ෂ-යක්ෂනීන් ඇදහීම ආදී ප්‍රාග්-බෞද්ධ ඇදහිලි හා විශ්වාස සහිත සමාජයට ස්ථාවර ආගමක අවශ්‍යතාව පැවතීම.
- බුදුදහම පිළිබඳව පූර්ව-අවබෝධයක් ලාංකිකයන් සතුවීම.
- තෙවන ධර්ම සංගායනාව හා අශෝක අධිරාජයාගේ ධර්ම ප්‍රචාරක කටයුතු හා මෙරට පාලකයා වූ තිස්ස හා අශෝක අධිරාජයා අතර පැවති මිත්‍රත්වය.
- මහින්දාගමනය හා ශ්‍රී ලාංකීය භික්ෂු ශාසනය පිහිටුවීම.
- රජු බුදුදහම වැළඳගැනීම එහි ව්‍යාප්තියට හේතුවීම.
- මහමෙව්නාව පූජාකිරීම, රාජකීයයන් හා ප්‍රභූන් බුදුදහම වැළඳගැනීම හා ඊට අනුග්‍රහ දැක්වීම.
- සංඝමිත්තා තෙරණියගේ ආගමනය හා භික්ෂුණී ශාසනය පිහිටුවීම.

**(ලකුණු 03 යි)**

**(iv) අනුරාධපුර යුගයේ අවසානය තෙක් බුද්ධාගම ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා දේශපාලනය සම්බන්ධයෙන් ඉමහත් බලපෑමක් ඇති කළ අයුරු විග්‍රහ කරන්න.**

- සංස්කෘතිය:
    - ✓ මිහිඳු හිමියන් ප්‍රමුඛ ධර්මදූතයන් වහන්සේ වැඩම කිරීම; ලක්දිව බුද්ධ ශාසනය පිහිටුවීම.
    - ✓ ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම.
    - ✓ භික්ෂුණී ශාසනය පිහිටුවීම.
    - ✓ භාෂාවේ හා අධ්‍යාපනයේ වර්ධනය.
    - ✓ කලාව, සාහිත්‍යය හා ගෘහ නිර්මාණ ශිල්ප වර්ධනය කෙරෙහි බුද්ධාගම බලපෑම.
    - ✓ විවිධ උත්සව.
    - ✓ පංචශීලය පදනම්කොටගත් සදාචාර අගයයන් සමාජය තුළ ස්ථාපිත වීම.

- දේශපාලනය:
    - ✓ තිස්ස රජුගේ දෙවන අභිෂේකයත් සමග ලංකාවේ රාජත්වය හා බුදුදහම අතර සම්බන්ධතාව ස්ථාපිතවීම (පසුකාලීන පාලකයන්ද 'දෙවනපිය' යන විරුදය භාවිතයට යොමුවීම).
    - ✓ රජු ඇතුළු රාජකීයයන් බුදුදහම වැළඳගැනීමෙන් බුදුදහම රාජ්‍ය ආගම බවට පත්වීම.
    - ✓ ධාතූන් වහන්සේ වැඩම කරවීම හා එය රාජ්‍ය උරුමයේ සංකේතය බවට පත්වීම.
    - ✓ බුදුදහම හා රාජත්වය අතර බිඳදැමීම දුෂ්කර වූ සම්බන්ධයක් ඇතිවීම පසුකාලීනව රාජත්වය දළදාව සමගද අනන්‍ය ලෙස සම්බන්ධ වීම.
    - ✓ භික්ෂූන් වහන්සේ පාලකයන් හා සමීපව කටයුතු කිරීම හා රාජ්‍ය විචාරයේදී උපදේශකයන් වශයෙන් කටයුතු කිරීම හා ආගම හා රජය අතර දැඩි අන්‍යොන්‍ය රැඳියාවක් නිර්මාණයවීම.

**(ලකුණු 08 යි)**

**4. "පළමුවන විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකෙන්නේ ප්‍රධාන වශයෙන් ඔහු විදේශාධිපත්‍යයෙන් රට මුදවාගෙන එක්සේසත් කළ බැවිනි" සාකච්ඡා කරන්න.**

- අභ්‍යන්තර දුෂ්කරතා හා අභියෝග හමුවේ (මේ පිළිබඳව පනාකඩුව තඹ සන්නස මූලාශ්‍රය වේ) රෝහණයේ බලය තහවුරු කරගැනීම.
    - කේශධාතුකාශ්‍යප හා ලෝකේශ්වර ආදී රුහුණේ පාලකයන් අභිබවනය කිරීමට සමත්වීම.

- ඉන්පසුව චෝළ බලයට එරෙහිව උපක්‍රමශීලී හා සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් මෙහෙයවීම මගින් චෝළ බලය පරාජය කිරීම. එසේ විශාල අධිරාජ්‍යයකට එරෙහිව කළ සටන ජයග්‍රහණය කිරීම.

- අයබදු නොගෙවා කැරලි ගැසූ රජරට වැසියන් මර්දනයට පැමිණි චෝළ හමුදාව රුහුණද ආක්‍රමණය කළ අතර පලුට්ඨගිරි (පලටුපාන) සටනින් රජු ඔවුන් පරාජය කිරීම.

- වීර රාජේන්ද්‍රගේ හමුදා ප්‍රහාර හමුවේ පරාජයට පත්ව වාකිරිගලට පසුබැසීම.

- කේශධාතුකාශ්‍යපගේ සොහොයුරෙකු ගුත්තහාලයේ ඇති කරන ලද කැරැල්ල මැඩ, මහානාගහුල සිට හමුදා තර කිරීම.

- වීර රාජේන්ද්‍රගේ මරණයත් සමග චෝළ දේශයේ හටගත් අර්බුද අවස්ථාව ප්‍රයෝජනයට ගෙන පොළොන්නරුවේ සිටි චෝළ හමුදාවට තුන්පැත්තකින් පහරදී පරාජය කිරීම.

- ක්‍රි. ව. 1070 දී ලංකාව එක්සේසත් කොට පොළොන්නරුව අගනුවර බවට පත්කර ගෙන පෙර සිරිත් අනුව පාලනය ගෙන යාම.

- මේ අයුරින් විදේශ තර්ජන අභිබවායාමට සමත්වීමත් පාලන හා විදේශ ප්‍රතිපත්තියත් හේතුකොටගෙන මේ රජු ශ්‍රේෂ්ඨත්වයට පත්වීම.

- <u>අභ්‍යන්තර පාලන ප්‍රතිපත්තිඃ</u>

  - ✓ බිඳවැටී තිබූ වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණය කරවීම (මහාදන්ති, මහහේලි, සරේහේරු, කටුන්දාර, වළාහස්ස ආදී වැව්).
  - ✓ කෘෂි ආර්ථිකය නැවත නගා සිටුවීම.
  - ✓ බුදු සසුන නගා සිටුවීමට කටයුතු කිරීම.
  - ✓ බුරුමයෙන් උපසම්පදා භික්ෂූණ් වැඩම කරවීම හා ත්‍රිපිටක ග්‍රන්ථ ගෙන්වා ගැනීම.
  - ✓ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය - වෙල්ගම් වෙහෙර, ජම්බුකෝළ විහාරය, දඹුලු විහාරය, ගිරිකණ්ඩ විහාරය ආදිය.
  - ✓ ශ්‍රීපාද වන්දනයට යන බැතිමතුන්ට පහසුකම් සැලසීම.
  - ✓ හින්දු ආගමටද අනුග්‍රහ දැක්වීම.

- <u>විදේශ ප්‍රතිපත්තිය</u>ඃ වෛවාහික සබඳතා මගින් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පුළුල් කිරීමඃ

  - ✓ අයෝධ්‍යාවේ ජගතිපාල රජුගේ දියණිය ලීලාවතී විවාහ කර ගැනීම.
  - ✓ තිලෝක සුන්දරී නම් කාලිංග දේශයේ කුමාරිකාවක් විවාහ කර ගැනීම.
  - ✓ සුන්දරී නම් කාලිංග කුමරියක් තම පුත් වික්‍රමබාහුට විවාහ කරදීම.
  - ✓ තම නැගණිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමාරයකුහට විවාහ කරදීම.
  - ✓ ලීලාවතී බිසවගේ දියණිය යශෝධරා කුමරිය වීරවම්මට විවාහ කරදීම.

**(ලකුණු 14 යි)**

**5. පොළොන්නරු රාජධානිය බිඳවැටීමට තුඩු දුන් සාධක පරීක්ෂා කොට දඹදෙණි රාජධානිය පිහිටුවීම සැකෙවින් සමාලෝචනය කරන්න.**

- පොළොන්නරුව බිඳවැටීමට බලපෑ සාධකඃ
  - ✓ වසර 200 ක් පමණ කාලයක් පැවති මෙම රාජධානිය බිඳවැටීමට හේතු ගණනාවක් බලපෑම.
  - ✓ I පරාක්‍රමබාහු රජුගේ දැඩි මධ්‍යගත පාලනය හා උරුමකරුවන් විනාශ කිරීම නිසා ඔහුගේ ඇවෑමෙන් කිසියම් බල රික්තකයක් නිර්මාණය වීම.

- ✓ රට එක්සේසත් කිරීමේදී හා විදේශ තර්ජනවලට එරෙහිව රජු මෙහෙයවන ලද යුධ මාලාවේ අනිටු ප්‍රතිඵල.
- ✓ දුර්වල පාලකයන් බලයට පත්වීම.
- ✓ යුධ සෙනෙවියන් බලවත් වීමඃ තාවුරු, කිත්ති, ආයෙෂ්මන්ත, පරාක්‍රම.
- ✓ සිහසුන සඳහා කාලිංග හා පාණ්ඩ්‍ය වාංශිකයන් අතර හටගත් අරගලය.
- ✓ ක්‍රි. ව. 1215 දී සිදුවූ කාලිංග මාඝගේ ආක්‍රමණය.
- ✓ විවිධ හේතු මත රජරට ආර්ථිකය බිඳවැටීම.
- ✓ වාරිමාර්ග පද්ධතිය බිඳවැටීම.
- ✓ වසංගත රෝග පැතිර යාම.

- දඹදෙණිය රාජධානිය පිහිටුවීමඃ
  - ✓ පොළොන්නරු රාජධානියේ පරිහානියෙන් පසුව දඹදෙණි රාජධානිය බිහිවීම.
  - ✓ රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමේදී පිහිටවූ මුල්ම රාජධානියයි.
  - ✓ වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ පිහිටීම. ආරක්ෂාව අතින් වැදගත් පිහිටීම හා ඒ නිසා දෙස්විදෙස් සතුරු තර්ජනවලට මුහුණදීම පහසු වීම.
  - ✓ පොළොන්නරු රාජධානිය බිඳවැටීමත් සමග ප්‍රාදේශීයව බිහිවූ තාවකාලික රාජධානි අතර වන්නි පාලකයෙකු වශයෙන් සිටි III විජයබාහු රජු විසින් මෙම රාජධානිය පිහිටුවීම.
  - ✓ ඔහු මෙන්ම ඔහුගේ පුත් II පරාක්‍රමබාහු දඹදෙණියේ වැදගත්ම පාලකයන් වශයෙන් සැලකීම. මාඝ පරාජයට පත්කිරීම.

**(ලකුණු 14 යි)**

**6. "උඩරට පාලකයෝ මුහුදුබඩ පළාත් පාලනය කළ පෘතුගීසීන්ට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ."**

**(i) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ කවු ද?**

සේනාසම්මත වික්‍රමබාහු

**(ලකුණු 01 යි)**

**(ii) පෘතුගීසීන් යටතේ රැකවරණය ලැබූ උඩරට පාලකයා සහ ඔහුගේ දියණිය නම් කරන්න.**

කරල්ලියද්දේ බණ්ඩාර හා ඔහුගේ දියණිය කුසුමාසන දේවිය

**(ලකුණු 02 යි)**

**(iii) උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට පෘතුගීසීන් පෙළඹවූ සාධක සැකෙවින් දක්වන්න.**

- මුළු දිවයිනේම දේශපාලන ආධිපත්‍යය ලබාගැනීම.
- උඩරට පාලකයන්, තම ප්‍රතිවාදීන් වූ ලන්දේසීන් සමග සබඳතා පවත්වනු ඇතැයි සැක කිරීම.
- උඩරට පාලකයන් සමග පැවති ගැටුම්ඃ I විමලධර්මසූරිය, සෙනරත් හා II රාජසිංහ.
- ආර්ථික අභිමතාර්ථඃ
  - ✓ වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම (පුවක්, අලිඇතුන්, කුරුඳු, මී ඉටි)
  - ✓ මුළු දිවයිනේම වෙළඳ ඒකාධිකාරය ලබාගැනීම.
  - ✓ ඉන්දියාවේ තන්ජෝරය හා මදුරාසිය වැනි ප්‍රදේශ උඩරට සමග පැවැත් වූ වෙළඳ සබඳතා වැළැක්වීම.
- උඩරට ප්‍රදේශවල සිය ආගම ව්‍යාප්ත කිරීම.

**(ලකුණු 03 යි)**

**(iv) පෘතුගීසීන්ට එරෙහිව උඩරට පාලකයන් අනුගමනය කළ යුදමය ප්‍රතිපත්තිය විචාරාත්මකව විමසන්න.**

- I විමලධර්මසූරිය, සෙනරත් හා II රාජසිංහ යන පාලකයන් තිදෙනාම පෘතුගීසීන්ට එරෙහිව යුධමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

  - **1594 දන්තුරේ සටන**

    මෙකල උඩරට පාලකයා වූයේ I වන විමලධර්මසූරිය රජුය. පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා වූයේ පේරෝ ලෝපේස් ද සුසා ය. පෘතුගීසි හමුදාව පසුබසින අවස්ථාවේ දී එම හමුදාව දන්තුරේ දී විමලධර්මසූරිය රජුගේ ප්‍රතිප්‍රහාරයට ලක් වූ අතර කපිතාන් ජනරාල් සුසා ඇතුළු පෘතුගීසි හමුදාව සමූල ඝාතනය කරනු ලැබීය. මෙය පෘතුගීසීන් පෙරදිග දී ලැබූ දරුණුතම පරාජයකි.

  - **1603 බලන සටන**

    1603 ජනවාරි මස ආක්‍රමණය සිදු විය. පෘතුගීසි කපිතාන් ජෙනරාල් දොන් ජෙරනිමෝ ද අසවේදු, සීමන් පිඤ්ඤෝ හා සමරකෝන් මුදලි ආක්‍රමණය මෙහෙයවූහ. පෘතුගීසීන් සමඟ සිටි පහතරට සිංහල සේනාව උඩරට රජුට එකතු වී පෘතුගීසීන්ට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම හේතු කොටගෙන බලන කොටුව අතහැර යාමට පෘතුගීසීන්ට සිදු විය.

  - **1630 රන්දෙණිවල සටන**

    මෙකල උඩරට පාලකයා වූයේ සෙනරත් රජුය. කොන්ස්තන්තීනු ද සා ආක්‍රමණය මෙහෙයවූ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා විය. සිංහල ප්‍රධානීන් කිහිප දෙනෙක් ඔවුන් යටතේ සිටි ලස්කිරිඤ්ඤ භටයින්ද සමඟ උඩරට රජුට එකතු වීමත් අධික වර්ෂාවත් හේතුකොටගෙන පෘතුගීසි යුධ ශක්තිය හීන විය. පෘතුගීසි හමුදාව රන්දෙනිවල දී වට කොට දින දෙකක් තිස්සේ කරන ලද සටනින් මහා අස්තාන කුමරු ප්‍රධාන උඩරට හමුදාව ජයග්‍රහණය ලැබීය. කොන්ස්තන්තීනු ද සා ද මරණයට පත් විය.

  - **1638 ගන්නොරුව සටන**

    මෙකල උඩරට පාලකයා වූයේ දෙවන රාජසිංහ රජුය. පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා වූයේ දියෝගු ද මේලෝ ද කස්ත්‍රෝය. ආක්‍රමණය 1638 මාර්තු මාසයේ දී සිදු විය. සෙංකඩගල නගරය අතහැර ගන්නොරුවෙහි රැකවල්ලා සිටි දෙවන රාජසිංහ රජු ප්‍රමුඛ සිංහල හමුදාව විසින් පෘතුගීසි හමුදාව වටලා සමූල ඝාතනය කරනු ලැබීය.

- මෙම සටන්වලදී පෘතුගීසීන්ට නුහුරු ගරිල්ලා සටන් ක්‍රමය අනුගමනය කිරීම හා උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීමෙන් නිර්මාණය වී තිබූ බාධක ප්‍රයෝජනයට ගැනීම.

- ලස්කිරිඤ්ඤ භට හමුදාව උඩරට හමුදාවට එකතු කරගැනීම.

- මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි විරෝධී කටයුතු කළ නිකපිටියේ බණ්ඩාරට ආධාර කිරීම.

**(ලකුණු 08 යි)**

**7. කොල්බෲක්-කැමරන් කොමිසම විසින් යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම හා පරිපාලන ප්‍රතිසංස්කරණවල වැදගත්කම පරීක්ෂා කරන්න.**

- ආණ්ඩුක්‍රම යෝජනාඃ
  - ✓ ව්‍යවස්ථාදායක (නිලලත් 9 / නිල නොලත් 6) හා විධායක (උපදේශක සභාවක් සේ කටයුතු කිරීමට) සභා පිහිටුවීම.
  - ✓ සීමිත මට්ටමෙන් වුවද මහජන මතය ප්‍රකාශයට පත්වීමට අවස්ථාව සලසා දීම.
  - ✓ අනාගත පාර්ලිමේන්තු ක්‍රමයේ මුල් බීජ රෝපණය වූයේ මෙම ප්‍රතිසංස්කරණ මගින් වීම.
  - ✓ ආණ්ඩුකාරයාගේ බලතල සීමා කිරීම.
  - ✓ ව්‍යවස්ථාදායක සභාවේ වාර්තා හා මහජන පෙත්සම් මාර්ගයෙන් බ්‍රිතාන්‍ය රජයට යටත්විජිතයේ තොරතුරු ලබාගැනීමට ආණ්ඩුකාරයාගෙන් පරිබාහිර වෙනත් මාර්ගයක් සපයා ගැනීම.

- පරිපාලන යෝජනාඃ
  - ✓ මෙතෙක් වෙන් වෙන් වශයෙන් පාරිපාලනය වූ පහතරට ප්‍රදේශ හා උඩරට ප්‍රදේශ එක්කොට මුළු දිවයිනම තනි පරිපාලන ඒකකයක් බවට පත්කොට ප්‍රධාන පළාත් 5 කට බෙදීම සහ ඒවා භාරව ඒජන්තවරුන් පත් කිරීම; දිස්ත්‍රික්කවලට උප ඒජන්තවරුන් පත් කිරීම.
  - ✓ සිවිල් සේවා ක්ෂේත්‍රයේ සිදුකරන ලද ප්‍රතිසංස්කරණ කැපී පෙනීම.
    - ඇතැම් නිලතල අවලංගු කිරීම හා ඇතැම් ඒවා ඒකාබද්ධ කිරීම.
    - වැටුප් අඩුකොට විශ්‍රාම වැටුප් අවලංගු කිරීම.
    - ඒ වෙනුවට සිවිල් සේවකයන්ට පුද්ගලික ව්‍යාපාරවල යෙදීමට තිබූ තහනම ඉවත් කිරීම.
    - මෙහි ප්‍රතිඵලයක් ලෙස සිවිල් නිලධාරීන් වතු වගා කටයුතුවලට සම්බන්ධ වීම; මහජනතාව හා නිලධාරීන් අතර දුරස්ථභාවයක් ඇතිවීම.
    - ඒ සමගම මොවුන් සිය නිලබලය වතු වගාවේ අභිවෘද්ධිය සඳහා යොදාගෙන අණපනත් ආදිය ගෙන ඒමට කටයුතු කිරීම හේතුකොටගෙන ස්වදේශිකයන් පීඩාවට පත්වීම.

(ඇතැම්විට අධිකරණ ප්‍රතිසංස්කරණ පිළිබඳවද ලියා තිබිය හැකියි.)

**(ලකුණු 14 යි)**

**8. 1948 සිට 1978 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික සංවර්ධනය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.**

**(i) ගොවි ජනපද ව්‍යාපාරය**

**(ii) ජනසතු ව්‍යාපාරය**

**(iii) කර්මාන්ත**

**(i) ගොවි ජනපද ව්‍යාපාරය**

- නිදහස ලබන අවස්ථාව වනවිට ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාම. නිදර්ශනඃ ගොවි ජනපද ව්‍යාපාර (ගල්ඔය, හුරුළු වැව), වාරිමාර්ග, ඉඩම් සංවර්ධනය.

- ප්‍රතිසංස්කරණය කරන ලද මහ වැව් ජලයෙන් අලුතෙන් අස්වද්දන ලද ඉඩම්වල වෙනත් ප්‍රදේශවලින් ගොවීන් ගෙන්වා පදිංචි කරවීම මූලික වශයෙන් ගොවිජනපද ව්‍යාපාරය මගින් සිදුවීම.

- වර්තමානයේ පවත්නා ගොවි ජනපද ව්‍යාපරය ආරම්භ වූයේ 1933 මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයෙනි. ඩී. එස්. සේනානායක මහතා මෙහිලා පුරෝගාමී විය.

- 1933 දීම කලා වැව (කගම) සහ නාච්චදූව වැව ආශ්‍රිතවද ගොවි ජනපද ආරම්භ වීම.

- ගොවි ජනපද පිහිටුවීමේ මූලික අරමුණු කීපයකිः
    - ✓ අධික ජනගහණයකින් යුතු ප්‍රදේශවල සිට සාපේක්ෂව අඩු ජනගහණයක් සිටි ප්‍රදේශවල ජනයා පදිංචි කරවීම.
    - ✓ ඒ සඳහා ඉඩම් අහිමි ගොවීන් තෝරාගෙන ඔවුන්ට කෘෂිකර්මාන්තයේ නිරත වීමට අවස්ථාව සලසාදීම.
    - ✓ දිවයිනේ වී අස්වැන්න ඉහළ දැමීම මගින් සහල් ආනයනයට යන වියදම අවම කිරීම.

- කලා වැව සහ නාච්චදූව ව්‍යාපාරවල ගොවීන් පදිංචි කරවීමේදී ඉස්රායලය, ලිබියාව හා ඉන්දියාව වැනි රටවල අත්දැකීම්ද උපයෝගී කර ගැනීම.
    - ✓ ගොවීන්ට නිවසක් ඉදිකිරීමට මූල්‍යාධාර රජය විසින් ලබාදීම. 1939 න් පසුව ගොවීන් පදිංචි කරවන අවස්ථාව වනවිට නිවාස ඉදිකොට තැබීම සිදුවිය.
    - ✓ ආරම්භයේදී මඩින් අක්කර පහක්ද ගොඩින් අක්කර තුනක්ද එක පවුලකට ලබාදෙන ලදී.
    - ✓ රජයේ වියදමින් ඉඩම් වගාවට සුදුසු පරිදි සකස් කර දීම හා වගාවට අවශ්‍ය වෙනත් සේවා සපයන ලද අතර මුල් අස්වැන්න ලැබෙන තුරු යැපීම් දීමනාවක් ලබාදීම.
    - ✓ මෙලෙස ලබාදුන් ඉඩම් අන්සතු කළ නොහැකි වීම.
    - ✓ ජනපදවලට අවශ්‍ය යටිතල පහසුකම් රජය මගින් සපයා දීම (මාර්ග, පාසල්, රෝහල්, තැපැල් හල් හා සමුපකාර සමිති ආදිය).

- මින්නේරියෙන් ආරම්භ වූ ගොවි ජනපද ව්‍යාපාරය වියළි කලාපයේ සෙසු ප්‍රදේශවලද ක්‍රමයෙන් ව්‍යාප්ත කෙරිණ.

- නිදහස ලබන අවධිය වනවිට මින්නේරිය, නාච්චදූව, කලාවැව (කගම), ඉරණමඩු, මිණිපේ, බෙරගම, පරාක්‍රම සමුද්‍රය, රිදීබැඳිඇල, ඇලහැර ආදී ජනපද පිහිටුවා තිබිණි.

- නිදහසෙන් පසු බලයට පත් වූ සෑම රජයක්ම නව ජනපද පිහිටුවීම සිදුකොට ඇත (හුරුළු වැව, දේවහුව, ගල් ඔය).

### (ii) ජනසතු ව්‍යාපාරය

- පෞද්ගලික අංශය සතුව පැවති ඇතැම් ව්‍යපාර රජයට පවරාගැනීම.

- මෙය 1956 දී බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව විසින් ක්‍රියාවට නැංවීම.

- බස් ජනසතුවෙන් ඇරඹි මේ ක්‍රියාවලිය රක්ෂණ, වරාය හා බැංකු කෙරෙහිද යොමුවීම.

- 1961 තෙල් ජනසතු කිරීම කැපී පෙනෙන අවස්ථාවක් වීම. ඒ යටතේ එතෙක් විදේශීය සමාගම් ඒකාධිකාරය යටතේ පැවති ඛනිජ තෙල් ආනයනය, ගබඩා කිරීම හා බෙදාහැරීම ඛනිජතෙල් සංස්ථාවට පැවරීම.

- 1972 හා 1975 වසරවලදී වතු ජනසතු කිරීම.

- නිවාස අයිතිය සීමා කරමින් අතිරික්ත නිවාස රජයට පවරාගැනීම.

- ඉඩම් අයිතිය සීමාකොට රජයට පවරාගත් ඉඩම් ගොවීන් අතර බෙදාදීම හෝ සමූපකාර නැතහොත් තරුණ සම්මාන ඉදිකිරීම. බහුතරයක් එසේ පවරාගත් ඉඩම් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරාදීම. කෙසේවෙතත් අකාර්යක්ෂම පාලනය නිසා රජය සතු වතු පාඩු ලැබීම.

**(iii) කර්මාන්ත**

- බ්‍රිතාන්‍ය පාලනයේ මුල් යුගය තුළ මෙරට කර්මාන්ත අංශය වර්ධනය කිරීමට පියවර නොගත්තද 1939 පමණ සිට කාර්මික අංශය කෙරෙහි සුළු නැඹුරුවක් දක්නට ලැබීම. තුනී ලෑලි, කඩදාසි, පිඟන්, සම්භාණ්ඩ, කොස්ටික් සෝඩා කර්මාන්ත ශාලා නියමු ව්‍යාපෘති වශයෙන් ආරම්භ වීම.

- කෙසේවෙතත් මේවා පාඩු ලැබීම නිසා නිදහසින් පසු 1953 දී තුනී ලෑලි සහ සම්භාණ්ඩ කර්මාන්ත ශාලා හැර අනෙක් ඒවා වසාදැමීම.

- නිදහසින් පසු ආණ්ඩුව සිමෙන්ති කම්හල පිහිටුවීම.

- බොහෝ රටවල් නිදහසත් සමග ආනයන ආදේශන කර්මාන්ත ආරම්භ කිරීමට පෙළඹුනත් ලංකාවේ ඒ තත්ත්වය දක්නට නොලැබීම.

- 1956 වනතුරු කර්මාන්ත පෞද්ගලික අංශය විසින් පවතවාගෙන යාමට ඉඩදීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබීම.

- සිරිමා බණ්ඩාරනායක රජය, නිදහස ලබා දශකයක් පමණ ඉක්මයන අවස්ථාවේ ආනයන ආදේශන කර්මාන්ත ඇති කිරීම සඳහා යොමුවීම.

- 1958 පමණ සිට සමාජවාදී කඳවුරේ රටවලින් කර්මාන්ත දියුණුව සඳහා ව්‍යාපෘති ආධාර හිමිවීම. සීනි, රෙදිපිළි, රබර්, යකඩ හා වානේ.

- 1961 සිට දේශීය හා විදේශීය ආයෝජකයන්ට විවිධ සහන ලබාදෙමින් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා දිරිගැන්වීම.

**(ලකුණු 14 යි)**

**9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) අනුරාධපුර යුගයේ වාරිමාර්ග ක්‍රමය**

**(ii) යාපනය රාජධානිය**

**(iii) කෝට්ටේ යුගයේ සංස්කෘතික වර්ධනය**

**(iv) මුහුදුබඩ පළාත්වල ලන්දේසි පරිපාලන ක්‍රමය**

**(v) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් සංස්කෘතික ප්‍රබෝධය**

**(vi) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය**

**(එක් කෙටි සටහනකට ලකුණු 07 බැගිනි)**

**(i) අනුරාධපුර යුගයේ වාරිමාර්ග ක්‍රමය**

- මුලින්ම ඉතා සරල ජලසම්පාදන ක්‍රමයක් ලෙස වාර්ෂිකව කෙටි තුළ කාලයක් වගා කටයුතු කිරීම සඳහා ඇළ මාර්ග මගින් ජලය සපයාගැනීම.
- ජනගහණ වර්ධනයත් සමග නිෂ්පාදනය වැඩිකිරීම අවශ්‍ය වූ නිසා ගම්වැව් ඉදිකිරීම.
- වසභගෙන් පසුව රාජ්‍යයේ මැදිහත්වීමෙන් විශාල වැව් තැනීම ආරම්භවීම
- විවිධ දිශාවලට ගලාගිය ගංගාවල ජලය එක්රැස්කොට අවශ්‍ය ප්‍රදේශයට ඒවා රැගෙනයාම සහ ගංගා හරස් කොට වේලි බැඳ සංකීර්ණ වාරිපද්ධතියක් සකස්කිරීම.
- කෘත්‍රිම ඇළ මාර්ග පද්ධතිය මගින් වාරි කර්මාන්ත එකිනෙකට සම්බන්ධ කිරීම (ඇළහැර ඇළ, යෝධ ඇළ හෙවත් ජය ගඟ).
- ගංගා හරස්කොට අමුණු බැඳීම (ඇළහැර අමුණ, මිණිපේ අමුණ, මහගල්කඩවල අමුණ).
- ක්‍රි.පූ. 3 වන සියවස සිට ක්‍රි.ව. 6 වන සියවස දක්වා වාරි කර්මාන්ත කරවූ පාලකයන් අතර කැපී පෙනෙන කිහිපදෙනෙකි:
  - ✓ දේවානම්පියතිස්ස - තිසා වැව
  - ✓ වසභ - මහවිලච්චිය, නොච්චිපොතාන, හිරිවඩුන්න ආදී වැව්
  - ✓ මහසෙන් - මින්නේරිය, හුරුළු, කවුඩුලු ආදී වැව්
  - ✓ I උපතිස්ස - තෝපා වැව
  - ✓ ධාතුසේන - කලා වැව, බලලු වැව, මානාමතු වැව ආදී
  - ✓ II මුගලන් - නාච්චදූව, පදවිය වැව්
  - ✓ II අග්බෝ - මිනිපේ අමුණ
- වැව් හා ඇළ මාර්ගවල තාක්‍ෂණික අංශය, ඒවා ඉදිකිරීම, භූමිය මැනීම හා සමකිරීම, බිසෝකොටුව, සොරොව්ව, පිටවාන, ඇතුල්වාන, වැව් බැම්ම, රළපනාව වැනි අංග.
- මෙහි වර්ධනය සඳහා පාලකයින්ගෙන් ලැබුණ අනුග්‍රහය ඒවායෙහි පරිපාලනයට සම්බන්ධ විවිධ නිලධාරීන් ගැන හමුවන තොරතුරු (අධිතය උතර - වාරිකර්මාන්ත නඩත්තු නිලධාරී / පියොවදාරන්නන් - වාර්මාර්ග පරීක්ෂකවරුන්).
- වාරිපද්ධතිය නඩත්තු නොකිරීම රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට පවා හේතු වූ බවට මතයක් පැවතීම.

**(ලකුණු 07 යි)**

**(ii) යාපනය රාජධානිය**

- යාපනය රාජධානිය පිළිබඳව ***යාල්පානවෛපවමාලෙයි***, ***ශෛගරාසසේකරමාලෙයි***, ***කෛලාශමාලෙයි***, ***රාජාවලිය***, ***නිකායසංග්‍රහය***, ***සැළලිහිණි සන්දේශය*** වැනි මූලාශ්‍රය වැදගත් වීම.

- ක්‍රි. ව. 13 වන සියවස අග වනවිට ජාවක චන්ද්‍රභානු විසින් යාපන ප්‍රදේශයේ බලය පැතිරවීම.

- පාණ්ඩ්‍යයන්ගේ ආධාරයෙන් II පරාක්‍රමබාහු රජු විසින් චන්ද්‍රභානු පරාජය කළ පසු පාණ්ඩ්‍යයන් සිය නියෝජිතයෙකු ලෙස චන්ද්‍රභානුගේ පුත්‍රයෙකු උතුරු ප්‍රදේශය පාලනයට පත්කිරීම.

- 1310-1311 අතර කාලයේ ආර්ය චක්‍රවර්තීන් උතුරේ පාලනය අල්ලාගැනීම.

- ආර්යචක්‍රවර්තීන් බ්‍රාහ්මණ කුලයට අයත් වූ අතර ඔවුන් පාණ්ඩ්‍ය රාජධානියේ දකුණේ ප්‍රදේශයක් වූ වෙච්චරුක්කයිනාටු නම් ප්‍රදේශයේ ප්‍රාදේශික අධිපතීන්ගේ පවුලකින් පැවැත ඒම.

- ආර්යචක්‍රවර්තී පාලකයෝ දොළොස් දෙනෙකු පිළිබඳ වාර්තා වේ:

    1. ශිංගෛ ආරියණ් (චිංකෛයාරියර්), එනම් විජය කුලංගෛ පළමු පාලකයා වීම.
    2. කුලශේකර ශිංගෛ ආරියණ්
    3. වික්කිරම ශිංගෛ ආරියණ්
    4. වරෝදය ශිංගෛ ආරියණ්
    5. මාර්තාණ්ඩ ශිංගෛ ආරියණ්
    6. කුණපූෂණ ශිංගෛ ආරියණ්
    7. විරෝදය ශිංගෛ ආරියණ්
    8. ජයවීර (චෙයවීර) ශිංගෛ ආරියණ්
    9. කුණවීර ශිංගෛ ආරියණ්
    10. කනගශූරිය (කණකශූරිය) ශිංගෛ ආරියණ්
    11. පරරාජශේකරණ්
    12. සංකිලි

- ක්‍රි.ව. 1344 දී ලංකාවට පැමිණි ඉබන් බතූතා විසින් ආර්යචක්‍රවර්තී පාලකයා, 'ලංකාවේ සුල්තාන්' ලෙස හඳුන්වා දෙනු ලැබීම.

- III වික්‍රමබාහු රජ දවස ආර්යචක්‍රවර්තී ගම්පොල රාජධානියේ ඇතැම් ප්‍රදේශවලට පහරදී බදු අයකර ගැනීම නිසා අලකේශ්වර ප්‍රභූරාජයා කෝට්ටේ බලකොටුව ගොඩනගා ආර්යචක්‍රවර්තිගේ බලය මර්දනයකර එම ප්‍රදේශ මුදා ගැනීම.

- VI වන පරාක්‍රමබාහු රජතුමා, සපුමල් කුමරයා යවා ආර්යචක්‍රවර්ති පරාජය කර යාපනය අල්ලාගැනීම.

- පෘතුගීසීන් විසින් ක්‍රි.ව. 1619 දී යාපනය අල්ලා ගැනීම.

**(ලකුණු 07 යි)**

**(iii) කෝට්ටේ යුගයේ සංස්කෘතික වර්ධනය**

- මෙහිලා අධ්‍යාපන හා සාහිත්‍ය අංශ වඩාත් කැපී පෙනීම.

- අධ්‍යාපනයඃ

    ✓ VI පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ පැවති දේශපාලන, ආර්ථික, ආගමික හා ශාසනික දියුණුව මෙන්ම රාජ්‍ය අනුග්‍රහයත් අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් විය.

    ✓ වීදාගම ශ්‍රී සනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කැරගල පද්මාවතී, පැපිලියානේ සුනේත්‍රාදේවි සහ එරබත්ගොඩ ධර්මරාජ යන පිරිවෙන් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.

    ✓ මෙම අධ්‍යාපන ආයතනවල සිටි භික්ෂූන් වහන්සේ විශාල ධර්ම ශාස්ත්‍රීය සේවයක නිරතවීම (කැරගල වනරතන, වීදාගම මෛත්‍රිය, තොටගමුවේ ශ්‍රී රාහුල, වැත්තැවේ ආදී තෙරවරුන්).

    ✓ මෙකී අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාද කාව්‍ය, නාටක, ජ්‍යොතිර්විද්‍යා වැනි විවිධ විෂයයන්ද ඉගැන්වීම.

    ✓ ගිහි පැවිදි පඬිවරුන් විවිධ අංශවලට අයත් ග්‍රන්ථ රචනයෙහි නිරත වීම (මහාකාව්‍ය, බුදුගුණ කාව්‍ය, සංදේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ හා ප්‍රශස්ති ග්‍රන්ථ ආදිය).

    ✓ වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් තරඟයට ග්‍රන්ථකරණයෙහි නියැලීම හේතුකොට ගෙන සාහිත්‍ය ප්‍රබෝධයක් හටගැනීම. වනවාසී සම්ප්‍රදාය කැරගල පද්මාවතී පිරිවෙනෙහිද ග්‍රාමවාසී සම්ප්‍රදාය තොටගමුවේ විජයබා පිරිවෙනෙහිද ක්‍රියාත්මක වීම.

    ✓ මෙකල පැවති අධ්‍යාපන ආයතන ජාත්‍යන්තර කීර්තියට පත් වී තිබීමඃ සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා දිවයිනට පැමිණීම.

- සාහිත්‍යයඃ

    ✓ ගිහි පැවිදි අධ්‍යාපනය දියුණුවීම හා සාහිත්‍යයේ දියුණුවක් ඇතිවීම.

    ✓ එකල විසූ ගිහි පැවිදි පඬිවරුන්ගෙන් සාහිත්‍යයේ දියුණුවට සුවිශේෂී දායකත්වයක් ලැබීම.

    ✓ මේ පඬිවරුන් සිංහල, පාලි, සංස්කෘත හා දෙමළ යන භාෂාවන්ගෙන් විවිධ ක්ෂේත්‍ර අළලා ගද්‍ය, පද්‍ය ග්‍රන්ථ රචනා කිරීමඃ
        - වීදාගම මෛත්‍රිය හිමි - බුදුගුණාලංකාරය, ලෝ වැඩ සඟරාව, හංස සන්දේශය.
        - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි - කාව්‍යශේඛරය, පඤ්චිකාප්‍රදීපය, සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය.
        - වැත්තැවේ හිමි - ගුත්තිල කාව්‍යය.

- ශ්‍රී රාමචන්ද්‍ර භාරතී - භක්තිශතකය.
- සයවන පරාක්‍රමබාහු රජතුමා - රුවන්මල නම් නිඝණ්ඩුව.
- සරජෝතිමාලෙයි නම් දෙමළ ජ්‍යොතිෂ්‍යශාස්ත්‍ර ග්‍රන්ථය.
- ධම්මදින්නාචාර්ය විමලකීර්ති හිමි - සද්ධර්මරත්නාකරය.
- ඉරුගල් කුලතිලක පිරිවෙන්පති හිමි - කෝකිල සන්දේශය.
- සයවන පරාක්‍රමබාහු රජු පිළිබඳ රචිත පැරකුම්බා සිරිත.
- නන්නූර්තුනෙයියාර් විසින් රුවන්මල පද්‍යයට නැගීම.

**(ලකුණු 07 යි)**

**(iv) මුහුදුබඩ පළාත්වල ලන්දේසි පරිපාලන ක්‍රමය**

- 1658 සිට 1796 දක්වා මෙරට මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමෙන් (VOC) පාලනය වීම.

- ඔවුන්ගේ මූලික අරමුණුː වෙළඳ (ආර්ථික) අරමුණු වඩාත් ප්‍රබල වීම. එසේම ආගම (ප්‍රොතෙස්තාන්ත ) ප්‍රචාරය කිරීම සහ ලංකාව තුළ සිය දේශපාලන බලය පිහිටුවීම

- මධ්‍ය පාලනය
  - ✓ ලන්දේසි පාලන සංවිධානයේ ප්‍රධානියා වූයේ බතාවියේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලද ආණ්ඩුකාරවරයාය. ඔහුට සහාය වීමට උපදේශක සභාවක් (පොලිටික් රාද්) තිබූ අතර ඔහුට පුළුල් බලතල පැවතීම.

  - ✓ දේශපාලන, යුධ හා නාවික වශයෙන් කාර්යාංශ තුනක් යටතේ පාලන කටයුතු සංවිධානය වීම.

- **ප්‍රාදේශීය පරිපාලනය**

  - ✓ ලන්දේසීන් ද දේශීය පාලන ව්‍යුහය හා යාන්ත්‍රණය එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.

  - ✓ ලන්දේසි පාලන ප්‍රදේශය කොමාන්ඩරිවලට (දිසාවනි) බෙදා තිබීම (කොළඹ, ගාල්ල, යාපනය) - කොළඹ ආණ්ඩුකාරයා යටතේත් අනෙක් ඒවා කොමදෝරුවරුන් යටතේත් පාලනය වීම.

  - ✓ කොමාන්ඩරි තුළද කලින් පැවති දේශීය පාලන ව්‍යුහය හා පාලන නිලතල ක්‍රියාත්මක කිරීම.

  - ✓ ඉහළ නිලතලවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම (දිසාවේ හා ඊට පහළ තනතුරු සඳහා).

  - ✓ දේශීය බද්ද සංවිධානය, රාජකාරි ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.

  - ✓ දේශීය ක්‍රමය පවත්වාගෙන යන අතර නව උසාවි පද්ධතියක් ඇති කිරීමː රාද් වැන් ජස්ටිටී-මහාධිකරණය / ලැන්ඩ්රාද්-ඉඩම් උපාවිය / සිවිල්රාද්-සිවිල් උසාවිය.

**(ලකුණු 07 යි)**

**(v) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් සංස්කෘතික ප්‍රබෝධය**

- ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ගේ ආගම් ප්‍රචාරක කටයුතු හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලින් බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම්වලට එල්ල වූ අභියෝග හේතු කොට ගෙන ඊට ප්‍රතික්‍රියාවක් ලෙස මෙම පුනර්ජීවන කටයුතු ආරම්භ වීමට මග පෑදීම.

- <u>හින්දු පුනර්ජීවනය:</u>

  ✓ ආරුමුග නාවලර් තුමා පුරෝගාමී වීම.

  ✓ ඔහු 1872 දී ශෛව ප්‍රගාශ විද්‍යාශාලෙ නම් පාසල පිහිටුවා හින්දු දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට කටයුතු කිරීම.

  ✓ දෙමළ භාෂා සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යයනය දිරිගැන්වීමට එතුමා පෙරමුණ ගැනීම.

  ✓ වන්නර්පොන්නෙයිහි මුද්‍රණාලයක් ආරම්භකොට හින්දු ආගමික පුනර්ජීවනයට අදාළ පොත් පත්, ලිපි ප්‍රකාශයට පත් කිරීම.

  ශෛවාගමට අදාළ පැරණි පොත පත සංස්කරණය කිරීම හා නව ග්‍රන්ථ රචනා කිරීම; බයිබලයේ කොටස් දෙමළ බසට පරිවර්තනය කිරීමට සහාය වීම.

  ✓ නාවලර්තුමා ස්වකීය සංස්කෘත හා ඉංග්‍රීසි ආදී භාෂා ප්‍රවීණත්වය පුනර්ජීවන කටයුතු සඳහා යොදාගැනීම.

- <u>ඉස්ලාම් පුනර්ජීවනය:</u>

  ✓ එම්. සී. සිද්ධි ලෙබ්බේ පුරෝගාමී විය.

  ✓ ඉස්ලාම් අධ්‍යාපනය නගා සිටුවීම: 1884 සහිරා විද්‍යාලය හා 1893 මහනුවර මුස්ලිම් බාලිකා විද්‍යාලය පිහිටුවීම.

  ✓ ඉංග්‍රීසි හා අරාබි භාෂා උගැන්මට මුස්ලිම්වරුන් දිරිගැන්වීම. මද්රාසා පාසල් ආරම්භ කිරීම.

  ✓ 'මුස්ලිම් නෙයිසන්' පුවත්පත ආරම්භ කිරීම.

  ✓ Ceylon Islam Review සඟරාවට අධ්‍යාපනයේ වැදගත්කම අවධාරණය කරමින් ලිපි සැපයීම.

  ✓ ඔරාබි පාෂාගෙන් මෙම පුනර්ජීවන කටයුතු සඳහා විශාල අනුබලයක් ලැබීම.

**(ලකුණු 07 යි)**

### (vi) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

- 1924 මැනිං-ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ අඩුපාඩු පරීක්ෂා කොට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඩොනමෝර් කොමිෂන් සභාව 1927 දී මෙරටට පත්කොට එවනු ලැබීය. එම කොමිසම විසින් යෝජනා කොට පසුව ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ වශයෙන් පහත සඳහන් කරුණු ගෙනහැර දක්වා තිබීම වැදගත් වේ.
- සර්වජන ඡන්ද බලය
    - ✓ මෙතෙක් ඡන්ද බලය හිමිවුණේ මුළු ජනගහණයෙන් 4% කට පමණි. කොමිසම මගින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට කළ යෝජනාවට ඒ. ඊ. ගුණසිංහ හැරුණු විට සෙසු ජාතික නායකයන් සියලු දෙනාම පාහේ විරුද්ධ වුවත් එය සම්මත විය. යුරෝපා නොවන ජනතාවක් අතර සර්වජන ඡන්ද බලය හිමි පළමු බ්‍රිතාන්‍ය යටත්විජිතය බවට ලංකාව පත්වීම.
    - ✓ මෙමගින් ජාතිමූල නියෝජනය අහෝසි කිරීම.
    - ✓ වයස අවුරුදු 21 ට ඉහළ සෑම කෙනෙකුටම ඡන්ද බලය හිමිවීම. මුලදී ස්ත්‍රීන්ට වයස අවුරුදු 30 ත් පුරුෂයින්ට වයස අවුරුදු 21 ත් ලෙස තීරණය කර තිබුණත්, පසුව වයස අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාට ඡන්ද බලය හිමිවීම.
- ආණ්ඩුකාරයා
    - ✓ ආණ්ඩුකරු සතු බලතල සීමා සහිත වීම. තමා ගනු ලබන තීන්දු තීරණ සෑමවිටම යටත් විජිත භාර මහලේකම්ට වාර්තා කළ යුතු වීම.
    - ✓ ආණ්ඩුකාරයාගේ වගකීම වූයේ ව්‍යවස්ථාදායකය හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ඉක්මන් හෝ අපරීක්ෂාකාරී ක්‍රියා වැළැක්වීමයි.
    - ✓ අණ්ඩුකාරයා සතු බලතලඃ
        - රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇමතීමේ බලය
        - රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරනු ලබන පනත් සම්බන්ධයෙන් කිහිපාකාරයකින් ක්‍රියා කිරීමට තිබූ බලතල
            - එක එල්ලේම එකඟවීම
            - මහරජතුමාගේ අනුමැතිය ලැබෙන තෙක් ඊට එකඟ නොවීම
            - සංශෝධන සහිතව හෝ රහිතව හෝ රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත යළිත් සලකා බැලීම සඳහා යොමු කිරීම.
            - වැදගත් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් අඩංගු පනතක් නම් එය සහතික කොට, පසුව නීතිගත කිරීම සඳහා මන්ත්‍රණ සභාවේ 2/3 ක ඡන්දය ඉල්ලා සිටීම.
            - එකඟ වුවත් එය ක්‍රියාවේ යෙදවීම හයමසකට කල්තැබීම
            - මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම
    - ✓ හදිසි අවස්ථාවකදී හෝ එබඳු අවස්ථාවක් පැනනැගී ඇතැයි හැඟෙන විට ඕනෑම දෙපාර්තමේන්තුවක පාලනය සියතට ගැනීම.
    - ✓ රාජ්‍ය සේවාවේ සේවකයින් පත්කිරීම, මාරු කිරීම, අස්කිරීම හා ඔවුන් සම්බන්ධ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම.
- රාජ්‍ය මන්ත්‍රණ සභාව
    - ✓ මෙතෙක් පැවති ව්‍යවස්ථාදායක හා විධායක සභා වෙනුවට ඇතිකළ රාජ්‍ය මන්ත්‍රණ සභාව සාමාජිකයන් 61 දෙනෙකුගෙන් සමන්විත වීම.

- ✓ ප්‍රදේශමූල ඡන්දයෙන් පත්කළ 50 දෙනා සුළු ජාතික නියෝජනය සඳහා නාමකරණයෙන් පත්කළ 8 දෙනා මෙන්ම නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් සංයුක්ත වීම.

- ✓ බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු සිදු වූ ආකාරයට මෙහ කටයුතුද සිදුවිය.

- ✓ මන්ත්‍රණ සභාව සතු විධායක බලය ක්‍රියාත්මක වූයේ විධායක කාරක සභා මගිනි.

- ▪ විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය
  - ✓ විධායක කාරක සභා 7 ක් පිහිටුවීය. ඒවා නම්,

    1. ස්වදේශීය කටයුතු
    2. කෘෂිකර්මය
    3. පළාත් පාලනය
    4. සෞඛ්‍යය
    5. කම්කරු කර්මාන්ත හා වෙළඳ කටයුතු
    6. අධ්‍යාපනය
    7. සන්නිවේදනය, ගමනාගමනය හා ප්‍රසිද්ධ වැඩ

  - ✓ විධායක කාරක සභාවක සාමාජික සංඛ්‍යාව අටකට නොවැඩි හතකට නොඅඩු වීම.

  - ✓ අමාත්‍ය මණ්ඩලය සකස් වී තිබුණේ මෙම විධායක කාරක සභා හතේ ප්‍රධානීන්ගෙන් සහ නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙනි.

**(ලකුණු 07 යි)**

★★★★★★